ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

ජාතික යෞවන් සේනාංකය

ඇබෑර්තු

ජාතික යෞවන් සේනාංකයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සහකාර අධ්‍යක්ෂ (පුහුණු) (MM 1-1)

02. සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) (MM 1-1)

03. උපදේශක (තොරතුරු තාක්ෂණ) (MA 1-1)

04. උපදේශක (ඉංග්‍රීසි භාෂා) (MA 1-1)

ඉහත තනතුරු ස්ථිර, සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට දායකත්වය හිමිය.

05. සහකාර අධ්‍යක්ෂ (පළාත්) (MM 1-1 Fixed) - නැගෙනහිර පළාත

06. මධ්‍යස්ථානාධිපති (JM 1-1 Fixed)

ඉහත (05) සහ (06) තනතුරු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.

මෙම තනතුරු සඳහා අයදුම් කරනු ලබන සෑම අයදුම්කරුවෙකුම,

අ. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

ආ. තනතුරට අදාළ කාර්යයන් මනාවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

ඇ. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

01. සහකාර අධ්‍යක්ෂ (පුහුණු) (MM 1-1) මූලස්ථානය සඳහා

අධ්‍යාපන සුදුසුකම් : **බාහිර අයදුම්කරුවන්**

1. ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ), ව්‍යාපාර පරිපාලනවේදී (මානව සම්පත් කළමනාකරණය), විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) විශේෂ, වාණිජවේදී (විශේෂ), විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණය (විශේෂ), ව්‍යාපාර කළමනාකරණවේදී (මානව සම්පත්) විශේෂ, ව්‍යාපාර පරිපාලනවේදී (මානව සම්පත් කළමනාකරණ) විශේෂ, විද්‍යාවේදී (ව්‍යාපාර කළමනාකරණය) විශේෂ, ශිල්පවේදී, ශ්‍රම අධ්‍යාපනවේදී, විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය), වාණිජවේදී (සාමාන්‍ය), ශාස්ත්‍රවේදී (ගෞරව) යන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබාගැනීමෙන් පසු පුහුණු විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දෙක (02) ක පළපුරුද්දක් ලබාතිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කනිෂ්ඨ කළමනාකාර සේවා ශ්‍රේණියේ අදාළ විෂය ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස : 1. අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප් ක්‍රමය : MM 1-1-රු.(53,175–10x1,375–15x1,910 = 95,575)

මීට අමතරව රජයේ අනෙකුත් අනුමත දීමනා ගෙවනු ලැබේ.

02 සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) (MM 1-1) මූලස්ථානය සඳහා

අධ්‍යාපන සුදුසුකම් : **බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2 හෝ 3)**

1. විද්‍යාවේදී ගණකාධිකරණ (විශේෂ), විද්‍යාවේදී මූල්‍ය කළමනාකරණ (විශේෂ), ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ), විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) විශේෂ, වාණිජවේදී (විශේෂ), විද්‍යාවේදී (ව්‍යාපාර කළමනාකරණය) විශේෂ, වාණිජවේදී (සාමාන්‍ය), යන ක්ෂේත්‍රයට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

   සහ

   උපාධිය ලබා ගැනීමෙන් පසු කළමනාකරණ හෝ මූල්‍ය විෂය ක්ෂේත්‍රයේ අවම වසර දෙක (02) ක පළපුරුද්දක් ලබා තිබීම.
2. කළමනාකරණ හෝ මූල්‍ය විෂයට අදාළවන්නා වූ, පිළිගත් වෘත්තීය ආයතනයක අවසාන මට්ටම පරීක්ෂණය සමත්වීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු මූල්‍ය විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දෙක (02) ක පළපුරුද්දක් ලබා තිබීම.
3. උසස් ජාතික ගණකාධිකාරී ඩිප්ලෝමාව සමත්ව තිබීම

   සහ

   සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් මූල්‍ය ක්ෂේත්‍රයේ වසර දෙක (02) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කනිෂ්ඨ කළමනාකාර සේවා ශ්‍රේණියේ අදාළ විෂය ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස : අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප් ක්‍රමය : MM 1-1- රු. (53,175–10x1,375–15x1,910 = 95,575)

මීට අමතරව රජයේ අනෙකුත් අනුමත දීමනා ගෙවනු ලැබේ.

03. උපදේශක (තොරතුරු තාක්ෂණ) (MA 1-1)

අධ්‍යාපන සුදුසුකම් : **බාහිර අයදුම්කරුවන්**

අ. අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී
  i. සිංහල /දෙමළ
  ii. ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

සහ

ආ. අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුන (03) ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

සහ

ඇ. පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ පිළිගත් අධ්‍යාපන ආයතනයකින් වසරකට නොඅඩු තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම.

සහ

ඈ. රාජ්‍ය හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක තොරතුරු තාක්ෂණ විෂය ඉගැන්වීම පිළිබඳව මාස (06) කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

සටහන : තොරතුරු තාක්ෂණ විෂයයන් සහිතව උපාධියක් ලබා ඇති අයට ඉහත (අ), (ආ), (ඇ) සහ (ඈ) සුදුසුකම් අවශ්‍ය නොවේ.

අභ්‍යන්තර අයදුම්කරුවන්

අ. ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ශ්‍රේණියන්හි පහත (ආ), (ඇ), (ඈ) සහ (ඉ) සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

ආ. අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී
  i. සිංහල/ දෙමළ
  ii. ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

ඇ. පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනයකින් වසරකට නොඅඩු තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම.

ඈ. සේවයෙහි ස්ථිර පත්වීම් දරිය යුතු අතර, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

ඉ. නියමිත දිනට පූර්වාසන්න ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු පහ (05) ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

වයස : ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් ක්‍රමය : MA1-1 රු.(27,910-10x300-7x350-4x495-20x660 = 48,540)

මීට අමතරව රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

04. උපදේශක (ඉංග්‍රීසි) (MA 1-1)

අධ්‍යාපන සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්

අ. අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී
  i. සිංහල/දෙමළ
  ii. ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

සහ

ආ. අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුන (03) ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

සහ

ඇ. පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ පිළිගත් අධ්‍යාපන ආයතනයකින් වසරකට නොඅඩු ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම.

සහ

ඈ. රාජ්‍ය හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ඉංග්‍රීසි භාෂා විෂය ඉගැන්වීම පිළිබඳව මාස (06) කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

සටහන : ඉංග්‍රීසි භාෂා විෂයයන් සහිතව උපාධියක් ලබා ඇති අයට ඉහත (අ), (ආ), (ඇ) සහ (ඈ) සුදුසුකම් අවශ්‍ය නොවේ.

අභ්‍යන්තර අයදුම්කරුවන්

අ. ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ශ්‍රේණියන්හි පහත (ආ), (ඇ), (ඈ) සහ (ඉ) සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

ආ. අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී
  i. සිංහල/දෙමළ
  ii. ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

ඇ. පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ පිළිගත් අධ්‍යාපන ආයතනයකින් වසරකට නොඅඩු ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම.

ඈ. සේවයෙහි ස්ථිර පත්වීම් දරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

ඉ. නියමිත දිනට පූර්වාසන්න ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

වයස : ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් ක්‍රමය : MA1-1 රු.(27,910-10x300-7x350-4x495-20x660 = 48,540) මීට

අමතරව රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා තනතුරු

05. සහකාර අධ්‍යක්ෂ (පළාත්) - නැගෙනහිර පළාත සඳහා

සුදුසුකම් : 1. ශ්‍රී ලංකා යුධ හමුදාවේ ලුතිනන් කර්නල් තනතුරට හෝ එම තනතුරට නොඅඩු නාවික / ගුවන් හමුදාවේ නිලයක වසර පහකට නො අඩු සේවා කාලයක් සපුරා තිබීම.

වයස : බඳවා ගන්නා දිනට වයස අවුරුදු 57 නොඉක්මවිය යුතුය.

වැටුප් ක්‍රමය : රුපියල් 53,175/- ක මාසික ස්ථාවර පරිශ්‍රමිකයක් තනතුරට හිමිවේ. එමෙන්ම ඔබ විශ්‍රාමිකයකු නම් ඔබට හිමිවන්නේ ජීවන වියදම් දීමනාවෙන් අර්ධයක් පමණි.

06. මධ්‍යස්ථානාධිපති

අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් යටත් පිරිසෙත් විෂයයන් 06 කින් සමත් විය යුතුය.

පළපුරුද්ද : ශ්‍රී ලංකා යුධ හමුදාවේ මේජර් නිලයක් හෝ ඊට නොඅඩු ත්‍රිවිධ හමුදාවේ නිලයක අවුරුදු 03 කට නොඅඩු සේවා කාලයක් සහිත විධිමත් විශ්‍රාම ලැබූ හෝ විධිමත් පරිදි ඉල්ලා අස්වී තිබිය යුතුය.

වයස : ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 50 නොඉක්මවිය යුතුය.

පාරිශ්‍රමිකය : 42,600/- පාරිශ්‍රමිකයක් හිමි වේ.එමෙන්ම ඔබ විශ්‍රාමිකයකු නම් ඔබට හිමි වන්නේ ජීවන වියදම් දීමනාවෙන් අර්ධයක් පමණි. මීට අමතරව රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

මෙම තනතුරු සඳහා අයදුම්කරන්නන් සුදුසු ආකෘතියක් අනුව ඉල්ලුම්පත්‍රයක් පිළියෙල කොට ඉල්ලුම්පත එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කර අදාළ සහතිකවල ඡායා පිටපත් සමගින් 2024.08.13 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ vacancy@youthcorps.lk යන විද්‍යුත් තැපෑල මගින් අයදුම්පත් යොමු කළයුතු වේ.

අසම්පූර්ණ, අදාළ සුදුසුකම් සපුරා නොමැති හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යක්ෂ,
ජාතික යෞවන් සේනාංක මූලස්ථානය,
අංක 420, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

අධ්‍යක්ෂ
ජාතික යෞවන් සේනාංකය
2024.07.30

තොරතුරු තාක්ෂණ හා ඉංග්‍රීසි භාෂා උපදේශක පුරප්පාඩු පවතින පුහුණු මධ්‍යස්ථාන

පළාත	පුරප්පාඩු පවතින මධ්‍යස්ථානය	තනතුර
මධ්‍යම	නුවරඑළිය	තොරතුරු තාක්ෂණ උපදේශක
	දඹුල්ල	
	වලපනේ	
නැගෙනහිර	දෙහිඅත්තකණ්ඩිය	
	ගෝමරන්කඩවල	
	ත්‍රිකුණාමලය	
උතුරු මැද	තැඹිරාව	
වයඹ	කුලියාපිටිය	
	නාත්තණ්ඩිය	
	ගලේවෙ	
	වෙන්නප්පුව	
උතුර	මුලතිව්	
	කිළිනොච්චි	
සබරගමුව	දෙහිඕවිට	
	කිරිඇල්ල	
දකුණ	ලුණුගම්වෙහෙර	
	සූරියවැව	
	වීරවිල	
ඌව	මහියංගනය	
	සියඹලාණ්ඩුව	
	තණමල්විල	
	වැල්ලවාය	
බස්නාහිර	මුල්ලේරියාව	
	මූලස්ථානය	
මධ්‍යම පළාත	පොංකඩගල	ඉංග්‍රීසි භාෂා උපදේශක
	වලපනේ	
	යටිනුවර	
	කෑගල්ල	
	නාවුල	
නැගෙනහිර	සේරුවිල	
	මැදිරිගිරිය	
වයඹ	පඬුවස්නුවර	
	කුලියාපිටිය	
	මාවතගම	
	වෙන්නප්පුව	
	වාරියපොල	
උතුර	වවුනියාව	ඉංග්‍රීසි භාෂා උපදේශක
	මුලතිව්	
සබරගමුව	දෙහිඕවිට	
	ගලිගමුව	
	කෑගල්ල	
දකුණ	නෙළුව	
	වීරකැටිය	
ඌව	මොණරාගල	
	බණ්ඩාරවෙල	
	සියඹලාණ්ඩුව	
උතුරු මැද	කලාවැව	